# තාක්ෂණික ආයතනය

# මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව

හා

# වාර්ෂික ගිණුම්

# 2014

(2015-12-21 දින පැවති 179 වෙනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී.)

# පටුන


| | | |
|---|---|---|
| 1 | දැක්ම පිළිබඳ සටහන | 1 |
| 2 | මෙහෙවර පිළිබඳ සටහන | 1 |
| 3 | අධ්‍යක්ෂතුමියගේ කාර්ය සමාලෝචනය | 2 |
| 4 | සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර | 4 |
| 5 | දේශීය සිසුන් පිළිබඳ විස්තර | 8 |
| 6 | විදේශීය සිසුන් පිළිබඳ විස්තර | 8 |
| 7 | අධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර | 9 |
| 8 | අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර | 9 |
| 9 | පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 11 |
| 10 | වැඩසටහන්, සම්මන්ත්‍රන සහ වැඩමුළු පිළිබඳ විස්තර | 13 |
| 11 | ලබාගත් ප්‍රදාන පිළිබඳ විස්තර | 14 |
| 12 | ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර | 14 |
| 13 | පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 15 |
| 14 | මූලධන වියදම් පිළිබඳ විස්තර | 15 |
| 15 | ව්‍යාපෘති විස්තරය (දේශීය / විදේශීය ප්‍රතිපාදන) | 15 |
| 16 | ව්‍යාපෘති වැය විස්තරය (දේශීය / විදේශීය ප්‍රතිපාදන) | 16 |
| 17 | මූල්‍ය ප්‍රගති විස්තරය (වියදම්) | 16 |
| 18 | මූල්‍ය ප්‍රගති විස්තරය (උත්පාදන) | 16 |
| 19 | මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2014 | 17 |
| 20 | 2014 වර්ෂයේදී ලැබුනු යටිතල පහසුකම් විස්තරය | 17 |
| 21 | වෙනත් විස්තර / මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රගතිය | 17 |
| 22 | විගනනය කරන ලද මූල්‍ය ප්‍රකාශන -2014 | 18 |
| 23 | විගණන කොමිටු වාර්තාව -2014 | 22 |
| 24 | විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2014 | 23 |
| 25 | විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු -2014 | 29 |

## 1 “දැක්ම” පිළිබඳ සටහන

තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ය මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

## 2 “මෙහෙවර” පිළිබඳ සටහන

කලාපයේ ක්‍රියාශීලී තාක්ෂණික ආයතනයක් බවට පත්කිරීම මෙන්ම ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපනය, ආර්ථික සහ සමාජීය දියුණුව සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදීම.

- සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ලගාවිය හැකි, නම්‍යතාවයෙන් යුතු කාර්යක්ෂම තාක්ෂණික අධ්‍යාපනයක් සහ පුහුණුව ලබාදීම.
- නව්‍යකරණ සහ නිර්මාණශීලී පරිසරයක් ගොඩනැගීම.
- වෘත්තීය අවශ්‍යතා සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ ව්‍යාපාරික ප්‍රජාව සමග ක්‍රියාශීලී සංවාදයක් ඇතිකිරීම.
- තරුණයින්හට සමාජයීය ආර්ථික මාර්ගයන් සඳහා විවෘත වන අවස්ථාවන් පුළුල් කිරීම.

## 3 අධ්‍යක්ෂතුමියගේ කාර්ය සමාලෝචනය

### (අ) කෙටි හැඳින්වීම

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මනා පිළිගැනීමක් ඇති ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (එන්.ඩී.ටී) අධ්‍යයන වැඩ සටහන පවත්වාගෙන යෑම සඳහා, මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය, ප්‍රධාන වශයෙන් වගකිව යුතු ප්‍රමබ පෙළේ උසස් අධ්‍යාපන ආයතනයකි.

2014 වර්ෂයේ දී ආයතනය ස්වකීය 14 වන වසරට පා තැබීය. ආයතනයට අවශ්‍ය භෞතික පහසුකම් නොමැති නිසා මොරටුව විශ්වවිද්‍යාලයේ පවත්නා පහසුකම් බෙදාවෙන්කර උපයෝගී කර ගැනීම හේතුවෙන් ආයතනයේ කටයුතු පවත්වා ගැනීම සඳහා බොහෝ හේතුවෙන් ආයතනයේ කටයුතු පවත්වා ගැනීම සඳහා බොහෝ අපහසුතාවයන්ට ආයතනය අඛණ්ඩව මුහුණ දීමට සිදුවුවද සමාලෝචනයට යොමුවන වර්ෂය තුලදී ආයතනය, ස්වකීය අපේක්ෂිත ජාතික සේවාව ඉතා විශිෂ්ඨ ලෙස අඛණ්ඩව ඉටු කරන ලදී.

### (ආ) ජයග්‍රහන

2014 ජනවාරි මස පාඨමාලා නමයක් සඳහා සිසුන් 350 ක් ආයතනයට ඇතුළත් කරන ලදී. එම පාඨමාලා නම් රසායන, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, ඉලෙක්ට්‍රොනික, නාවික, යාන්ත්‍රික සහ නාවුක වශයෙනි. නවක සිසුන් සඳහා වූ නම්නීකරණ වැඩසටහන සහ කඩිනම් ඉංග්‍රීසි පංති පැවැත්වීම සාර්ථකව සිදු කරන ලදී. ආයතනයේ අධ්‍යයන ක්‍රියාකාරකම් අදාල අධ්‍යයන වැඩසටහන් ලේඛන අනුව ක්‍රියාත්මක කරන ලදී. ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කරන ලද සිසුන්ට ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සඳහා වූ ඩිප්ලෝමා ප්‍රදාන උත්සවය නියමිත අවස්ථාවේදී පවත්වන ලදී. සැලසුම් කරන ලද පරිදි තෙවන වර්ෂ සිසුන් සඳහා කාර්මික පුහුණු වැඩසටහන, ජාතික ආධුනිකත්ව කාර්මික පුහුණු අධිකාරියේ සම්බන්ධීකරණ ඇතිව පවත්වන ලදී.

සමාලෝචනයට යොමුවන වර්ෂයේ කැපි පෙනුන ජයග්‍රහනය වූයේ අත්‍යාවශ්‍යවම තිබූ නිරන්තර අවධානය යොමුවන දිගුකලක් අපේක්ෂිතව සිටි, ආයතනය ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ලත් ප්‍රගතිය වේ. ව්‍යාපෘතියට සම්බන්ධ ක්‍රියාකාරකම් පසුගිය වසරේ උත්සවාකාරයෙන් ආරම්භ කිරීමට අත්තිවාරම් තැබීමත් සමගම CATIC චීන කොන්ත්‍රාත්කරු ඔවුන්ගේ ව්‍යාපෘති කාර්යාලය ස්ථාපිත කරන ලද අතර DG5 දේශීය වාස්තු විද්‍යා ආයතනයද සැලසුම් නිර්මාන කටයුතු කිරීමට යොදවා ගන්නා ලදී. ව්‍යාපෘතියේ අරමුදල් ගිවිසුමේ කටයුතු අවසන් කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කිරීම මහජන චීනයේ රාජ්‍ය ඒජන්තවරුන් සහ ශ්‍රී ලංකා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. චීන ණය මුදල පිළිබඳ කොන්දේසි සම්බන්ධ දෙපාර්ශවයටම එකග විය නොහැකි බව ප්‍රත්‍යක්ෂ වූ පසු එයට විකල්පයක් ලෙස කැබිනට් මණ්ඩලය විසින් දේශිය බැංකු දෙකක් වන හැටන් නැෂනල් බැංකුවෙන් හා කොමර්ෂල් බැංකුවෙන් ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලබා ගැනීම අනුමත කරන ලදී. නව ක්‍රමය යටතේ ICC දේශිය කොන්ත්‍රාත් ආයතනය, කැබිනට් පත්‍රිකාවක් මගින් නැවත කොන්ත්‍රාත් භාරකරු ලෙස තෝරා පත් කරගන්නා ලදී. ඒ අනුව උසස් අධ්‍යාපන ආයතනය සහ ICC අතර කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව ව්‍යාපෘති කොන්ත්‍රාත් අනුව කෙරෙන කටයුතු වර්ෂ අවසානයේදී ආරම්භ විය.

## (ඇ) අසාර්ථකවීම සහ සාධාරණීයකරණය

මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය 2000 වර්ෂයේ ආරම්භ වූ දා සිටම එහි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සංවර්ධනයක් කිරීමට නොහැකිවූයේ ආයතනය බොහෝ සෙයින් අපහසුතාවයන්ට මුහුණ දුන් හෙයිනි. විශ්වවිද්‍යාල සමග පවත්නා පහසුකම් වෙන්කර ගැනීමේදී ඇතිවුනු සීමාවන් හේතුවෙන් වාර්ෂිකව ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වන 350, දශක තුනක කාලසීමාවක් තුල එලෙසම පැවතුන අතර 2014 වර්ෂයේදී ද එම සංඛ්‍යාව එපරිද්දෙන්ම පැවතුනි. විෂය මාලාවේ සංයෝජනයක් තුලින් හඳුනාගනු ලැබූ අධ්‍යාපන මට්ටම උසස් කිරීම, මුළුමුනින්ම ක්‍රියාත්මක කිරීම, මතු සඳහන් හේතුව නිසාම, කාර්ය මණ්ඩලයටත් සිසුන්ටත් අපහසු කාරනයක් විය. දිර්ඝ කාලීනව පැවත එන මෙම බාධකයන්ට හොඳම විසඳුම වනුයේ අපේක්ෂිත පරිදි ආයතනය නව ස්ථානගතකොට සංවර්ධනය කිරීමය.

## (ඈ) අනාගත සැලැස්ම

ආයතනයේ අනාගත සැලසුම් පොදුවේ රැඳි ඇත්තේ " මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය නව ස්ථානගත කිරීම සහ සංවර්ධනය" කිරීමේ මූලික සංවර්ධනය ව්‍යාපෘතියක් සමගය. මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා ඇතුලත් කර ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව 350 සිට 1000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම තොරතුරු තාක්ෂණය, ප්‍රමාණ සමීක්ෂණ, යාන්ත්‍රික විද්‍යුතය සහ ගුවන් ඉංජිනේරු තාක්ෂණය වැනි විෂය ධාරාවන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා වැඩ සටහනට ඇතුලත් කිරීමටද සැලසුම් කර ඇත. ඒ සමගම ජාතික තාක්ෂණික වැඩසටහන සාර්ථකව නිමකළ සිසුන්හට පශ්චාත් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩ සටහනක්ද ආරම්භ කිරීමටද සැලසුම් කර ඇත.මෙම අරමුණ සාක්ශාත් කර ගැනීම සඳහා උනන්දුවක් දක්වන සියලුම දෙනා සක්‍රීයව දායකත්වය ලබා දෙමින් කටයුතු කරන අතර මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණ ආයතනය දැනට පවත්නා ශිෂ්‍ය සංඛ්‍යාව සමගින් පවත්නා ක්‍රමය තුල ඇති සාධනීය අවස්ථා උපයෝගී කර ගනිමින් ගුණාත්මක භාවයෙන් වැඩි ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක කිරීමේ ජාතික වගකීම අඛණ්ඩව කරගෙන යනු ඇත.

ව්‍යාපෘති විෂය පථය

- ශ්‍රී ලංකාවේ හෝමාගම, දියගම පරිශ්‍රයේ නව ගොඩනැගිලි සංකීර්නයට යටිතල පහසුකම් ලබාදීම.
- දේශන ශාලා සහ පරිපාලන සංකීර්නයට අවශ්‍ය උපකරන සහ දැව භාණ්ඩ, කර්මාන්ත ශාලා සඳහා අවශ්‍ය රසායනාගාර උපකරන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරන, තොරතුරු තාක්ෂණ උපකරන රථවාහාන ආදිය සැපයීම සහ සවිකිරීම.
- කාර්ය මණ්ඩල පුහුණුව සහ විෂය මාලා සංවර්ධනය.

## 4. සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර

### 4.1 ජාතික තාක්ෂණික පාඨමාලාවේ ඉතිහාසය පිළිබඳ කෙටි විස්තරයක් සහ මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනය ස්ථාපිත කිරීම.

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ (එන්.ඩී.ටී) මූලාරම්භය මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ දී ඇතිවූන අතර එය 1940 ගනන් දක්වා වූ කාලයකට දිව යනු ලැබේ. එහි ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බී.එස්.සී (ඉංජිනේරු) උපාධියට සිසුන් සූදානම් කරන, වර්ෂ හතරක තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවට අමතරව කනිෂ්ඨ කාර්මික නිලධාරි දෙවර්ෂ පාඨමාලාවන් ක්‍රියාත්මක කරන ලදී. කනිෂ්ඨ කාර්මික නිලධාරී පාඨමාලාව ඉතා හොඳ පිළිගැනිමක් ලද මධ්‍යම මට්ටමේ පාඨමාලාවක් වූ අතර මෙම පාඨමාලාව අවසන් කළ අය රටේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා බොහෝ සෙයින් දායක වූහ.

1960 වර්ෂයේදී මොරටුව, කටුබැද්දෙහි ප්‍රායෝගික තාක්ෂණික ආයතනය පිහිටුවීමත් සමගම කනිෂ්ඨ කාර්මික නිලධාරී (එන්.ඩී.ටී) පාඨමාලාව මරදානේ සිට මොරටුවට මාරුකරන ලදී. කැනඩා රජයේ ආධාර ඇතිව (අයි.පී.ටී) පිහිටු වූයේ ප්‍රායෝගික මූලාශ්‍ර සහිත මධ්‍යම මට්ටමේ ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා නිර්මාණය කිරීම සහ ක්‍රියාත්ම කිරීමටය.

1966 වර්ෂයේ දී ප්‍රායෝගික තාක්ෂණික ආයතනය, ලංකා කාර්මික කොලීජිය ලෙස උසස් කරන ලද අතර පාඨමාලා ව්‍යාප්තියත් සමගම වේගවත් සංවර්ධනයක් ද ඇතිවිය. ලංකා තාක්ෂණික කොලීජිය වර්ෂ පහක කාලයක් සඳහා වූ තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී. තවද ජේ.ටී.ඕ පාඨමාලාව සංශෝධනය කොට යාන්ත්‍රික පුහුණුවක්ද ඇතුලත් කොට, එය වසර තුනක ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් බවට පත් කරන ලදී. මේ සංවර්ධන ක්‍රියාකාරීත්වයත් සමඟ, ලංකා තාක්ෂණික (සී.සී.ටී) එකම විශ්වවිද්‍යාලය යටතේ වූ, මණ්ඩපයක් බවට 1972 දී උසස් කරන ලදී. එතැන් සිට උසස් අධ්‍යාපන අමාත්‍යංශය වෙනුවෙන් එන්.ඩී.ටී පාඨමාලාව, විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබිය. 1987 දී එන්.ඩී.ටී පාඨමාලාව, 1978 අංක 16 දරණ පනත අනුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලාවක් බවට පත්වූ අතර මෙම පාඨමාලාවට ඇතුලත් වීමේ සුදුසුකම් වූයේ ජී.සී.ඊ උසස් පෙළ සමත්වීමය. මොරටුව විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මකවන (අයි.ටී.යූ.එම්) 2000 වසරේ අංක 3 දරණ ආඥා පනත යටතේ ස්ථාපිත කරන ලද්දේ එන්.ඩී.ටී සහ එයට සමාන්තර පාඨමාලා මූලික වශයෙන් ක්‍රියාත්මක කිරීමටය. තාක්ෂණික ආයතනය, කළමණාකරන මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වන අතර, පාඨමාලාවල ස්වාධීන සංශෝධනයන් සඳහා ඉවහල්වන, භෞතික වශයෙන් වෙන්ව පිහිටුවන ලබන ආයතනයක් ලෙස පිහිටුවීමේ, කාර්ය භාරය ඉටුවීම එම මණ්ඩලයෙන් අපේක්ෂා කෙරේ. ජේ.ටී.ඕ / එන්.ඩී.ටී සම්පූර්ණ කරන ලද අය ජාතියේ සංවර්ධන ක්‍රියාවලියට අතිවිශාල වශයෙන් දායකත්වයක් ලබා දෙති, එන්.ඩී.ටී පාඨමාලාවෙන් පුළුල් අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දෙන අතර මධ්‍යම මට්ටමේ කාර්මික කටයුතු ඉටුකිරීමට අවශ්‍ය හැකියාවන්ද ලබාදෙයි. තවද එය වැඩිදුර ශක්තිමත් පදනමක් ද ඇති කරනු ලැබේ. රටේ පවත්නා මධ්‍යම මට්ටමේ පාඨමාලාවල තත්වය මනින මිනුම් දණ්ඩයක් බවටද මනා පිළිගැනීමක් ලෙස එන්.ඩී.ටී පාඨමාලාව පත්ව ඇත.

## 4.2 ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන පිළිබඳ කෙටි හැඳින්වීමක්

මෙම පාඨමාලාවේ මූලික අරමුණ වනුයේ අප රටෙහි කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය වන විවිධ ක්ෂේත්‍රවලට අදාල ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් බිහිකිරීමය. ආයතනය ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන, 350 මුළු ශිෂ්‍ය සංඛ්‍යාවකට විෂයධාරා නමයක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. අදාල විස්තර පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| රසායනික ඉංජිනේරු තාක්ෂණය | 25 |
| සිවිල් ඉංජිනේරු තාක්ෂණය | 80 |
| විදුලිය ඉංජිනේරු තාක්ෂණය | 40 |
| විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය | 40 |
| නාවික ඉංජිනේරු තාක්ෂණය | 15 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය | 60 |
| නාවුක අධ්‍යයන තාක්ෂණය | 15 |
| පොලිමර් තාක්ෂණය | 25 |
| පේෂකර්ම හා රෙදිපිලි තාක්ෂණය | 50 |

මෙයට අමතරව හමුදාවන්ට සහ විශ්වවිද්‍යාල අනධ්‍යයන කායයී මණ්ඩලය සඳහා ශිෂ්‍යයින් පස් දෙනෙක් උපරිම වශයෙන් ඇතුලත් කර ගැනීමට ඉඩ සලස්වනු ඇත.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම එයටම ආවේනික වූ ක්‍රියාවලියක් තුලින් සිදුවේ. රජයේ ගැසට් පත්‍රයේ තෝරාගත් ප්‍රතිපත්ති පත්‍ර සහ වෙබ් අඩවිය තුල පළවන ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. පසුගිය ජී.සී.ඊ උසස් පෙළ අඛණ්ඩව තෙවරක් පෙනී සිටි සිසුන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. ඉසෙඩ් ස්කොර් දිස්ත්‍රික්ක / විශේෂ කුසලතා වෙන්කිරීම (විශ්වවිද්‍යාල ඇතුළත් කිරීම් මෙන්) සහ විවිධ විෂය ධාරාවන්ට ඇති ඔවුන්ගේ මනාපය පදනම් කරගත් ශිෂ්‍යයින් ඇතුලත් කරගනු ලැබේ.

පරිපූර්ණ ඩිප්ලෝමාධාරියකුගෙන් මූලිකව අපේක්ෂා කරනුයේ වෘත්තිමය ඉංජිනේරුවරයකු හෝ කළමනාකරුවකු සහ ක්ෂේත්‍රය / වැඩපල මට්ටමේ ශ්‍රම බලකාය අතර පවත්නා සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමයි. මෙම ක්‍රියාදාමය තුලින් ඩිප්ලෝමාධාරියාට තමන් වෘත්තීමය ලෙස හැඩගස්වා ගැනීමටත් සම්බන්ධීකරණ සහ කළමනාකරණ කුසලතාවයන් දියුණු කරගැනීමටත් අවශ්‍ය වේ. ඔහු / ඇය තමා තෝරාගත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතුය. මෙම අවබෝධය තුලින් ඔහු / ඇය වෘත්තීමය ඉංජිනේරුවරයකුගේ නව්‍යකරණය / නිර්මාණ ඇගයීමට හැකිවන අතර තම සහායකයින් සමග අදහස් හුවමාරුකර නව්‍යකරණය / නිර්මාණය යථාර්ථයක් බවට පත්කල හැකිවනු ඇත.

මෙම පාඨමාලාව දෑ අවුරුදු අධ්‍යයන කටයුතු සඳහා වන අතර එක් අවුරුදු කර්මාන්ත පුහුණුවකින්ද සමන්විතය. පළමු වසරට අදාල විෂයයන් සමාන්තර බව, ස්ථාවරත්වය සහ මූලික විද්‍යාවන් පිළිබඳ ශිෂ්‍යයාගේ දැනුම සහ ඔහු / ඇය තෝරාගනු ලැබූ විශේෂ විෂයධාරා අධ්‍යයනය හඳුන්වා දීම සඳහාය. මෙය ඉංජිනේරු විද්‍යා අභ්‍යාස සඳහා අවශ්‍ය මූලික කුසලතාවයන් හෙළිදරව් කරනු ඇත. (උදා: වැඩපොල තාක්ෂණ ඉංජිනේරු සැලසුම්) එක් විෂය ධාරාවක් සඳහා ශිෂ්‍යයා විසින් තෝරාගනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාල එකක් හෝ ඊට වැඩි ක්ෂේත්‍ර විෂයයක් ලබාදෙනු ඇත. (උදා: සිවිල් ඉංජිනේරු විෂය ධාරාව සඳහා සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය විසින් ගොඩනැගිලි ඉදිකිරීම උගන්වනු ලැබේ.)

පහත සඳහන් කරුණු හේතුවෙන් පළමු වසරේදී ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය වේ.

1 ඩිප්ලෝමාධාරියකුගේ වෘත්තීයෙන් සම්බන්ධීකරණ කටයුතු ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. එනිසා සිසුන් තම අවබෝධ කර ගැනීම, කථනය, සහ වාර්තා ලිවීම පිළිබඳ කුසලතාවයන් වැඩි දියුණු කර ගත යුතුය.
2 ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව මුළුමුනින්ම ක්‍රියාත්මක කෙරෙනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. බොහෝ සිසුන් ජී.සී.ඊ උසස් පෙළ දක්වා තමන්ගේ ඉගෙනීම් කටයුතු කර තිබෙන්නේ සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් වන හෙයින් ඒ අයගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීනත්වය බොහෝ සෙයින් වෙනස් වන අතර දියුණු කර ගැනීමට බොහෝ ඉඩකඩ ඇත.

දෙවන වසරේ විෂයයන් තුල ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍ර තුල විවිධ ඉංජිනේරුමය න්‍යායාත්මක සිද්ධාන්තවල නිරතව සිටීමය.

තෙවන වර්ෂය යොදාගෙන ඇත්තේ කර්මාන්තයෙහි නිරතවී ලබන අත්දැකීම් ලබා ගැනීම සඳහාය. පිලිගත් කර්මාන්ත ආයතනයන්හිදී ලබාදෙන පුහුණුව සංවිධානය කරනු ලබන්නේ සහ අධීක්ෂණය කරනු ලබන්නේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සහ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ කර්මාන්ත පුහුණුව භාර කථිකාචාර්යවරයා විසිනි.

වසර 3 ක ඉගෙනීමෙන් සහ පුහුණුවීමෙන් අනතුරුව සමත්වන සිසුන් හට විශ්වවිද්‍යාලය විසින් අනුමත කර ඇති කුසලතා නිර්නායක අනුව සාමාන්‍ය, සම්මාන හෝ විශිෂ්ඨ වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ.

ලකුණු අනුව නිරීක්ෂනය කෙරෙන අධ්‍යයනයකදී හෙළිදරව් වී ඇති පරිදි ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව ලබායන අයගෙන් එසේ අධ්‍යයන කටයුතු අවසන් කර වසරක් තුල රැකියා නියුක්ත වීම 100% බව පෙන්නුම් කෙරේ.

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අංශයේ දැනට ක්‍රියාත්මක වන නව විෂය කලාව ඉදිරිපත් කරනු ලැබුවේ 2005 වර්ෂයේ දී පළමු වසර සිසුන් සඳහා වන අතර දෙවන වසර සිසුන් සඳහා 2006 වර්ෂයේදී ය. එහි අරමුණ වුයේ, කර්මාන්ත ලෝකයේ වර්තමාන තාක්ෂණ දියුණුව හා සමගාමීවන, සිසුන් තෝරාගත් විෂයධාරාවන්හි ඔවුන්ගේ දැනුම පුළුල් කිරීමය.

## කාර්ය මණ්ඩල සහ සිසුන් පිළිබඳ විස්තර

| අධ්‍යයන අංශ | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණ | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 243 | කථිකාචාර්යවරු<br>P –05<br>V- 04<br>උපදේශකවරු<br>T – 04 | P- 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 248 | කථිකාචාර්යවරු<br>P – 07<br>C- 02<br>V- 07<br>උපදේශකවරු<br>T – 03<br>V – 16 | P- 01 |
| පොලිමර්, රෙදිපිලි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 288 | කථිකාචාර්යවරු<br>P – 09<br>C- 01<br>T-01<br>V- 10<br>උපදේශකවරු<br>T – 04<br>V – 05 | T- 01 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 245 | කථිකාචාර්යවරු<br>P – 06<br>C- 01<br>V- 05<br>උපදේශකවරු<br>T – 12<br>V – 06 | T- 01 |
| අන්තර්විෂය මාලා අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | - | කථිකාචාර්යවරු<br>P – 07<br>C- 01<br>T- 01<br>V- 02<br>උපදේශකවරු<br>T – 02<br>V – 02 | T- 01 |

P – ස්ථිර
C- කොන්ත්‍රාත්
T- තාවකාලික
V- බාහිර

## 5. දේශීය සිසුන් පිළිබඳ විස්තර

ආයතනයට සිසුන් 350 ක් ඇතුලත් කරගනු ලබන අතර ක්ෂේත්‍ර 9 කින් සමන්විත වේ. එනම් රසායනික, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, විද්‍යුත් හා විදුලි සන්දේශ, නාවික, යාන්ත්‍රික හා නාවුක වේ.

| අධ්‍යයන අංශය | පාඨමාලාව | මාධ්‍යය | සිසුන් ඇතුලත් කිරීම 2014 | පළමු වසර සිසුන් | දෙවන වසර සිසුන් | තෙවන වසර සිසුන් | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණ. | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 80 | 82 | 79 | 82 | 66 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 90 | 84 | 79 | 85 | 73 |
| පොලිමර්, රෙදිපිලි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 100 | 98 | 94 | 96 | 72 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 80 | 83 | 79 | 83 | 72 |
| අන්තර්විෂය මාලා අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | | | | | |
| එකතුව | | | **350** | **347** | **331** | **346** | 283 |

## 6. විදේශීය සිසුන් පිළිබඳ විස්තර

ආයතනයට විදේශීය සිසුන් ඇතුළත් කරගනු නොලැබේ.

## 7. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර:

ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ස්ථිර සාමාජිකයන් 34 දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා කොන්ත්‍රාත්, තාවකාලික, සහ බාහිර කාර්ය මණ්ඩලය යොදවා ගනු ලැබේ.

| අධ්‍යයන අංශය | විෂයය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | ඉංජිනේරු ඉගැන්වීම් සහයක | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණ. | සිවිල් | ඉංග්‍රීසි | - | - | 04 | 01 | - | 04 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය | යාන්ත්‍රික හා නාවුක අධ්‍යයනය | ඉංග්‍රීසි | - | - | 04 | 02 | 01 | 03 |
| පොලිමර්, රෙදිපිළි සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය | පේෂකර්ම<br>පොලිමර්<br>රසායනික | ඉංග්‍රීසි | - | - | 02<br>01<br>- | -<br>02<br>03 | 01<br>-<br>- | 04 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | විදුලිය<br>ඉලෙක්ට්‍රොනික | ඉංග්‍රීසි | - | - | -<br>- | 03<br>03 | -<br>- | 06<br>06 |
| අන්තර්විෂය මාලා අධ්‍යයනය | ගණිතය<br>තොරතුරු තාක්ෂණය<br>ඉංග්‍රීසි | ඉංග්‍රීසි | - | - | 02<br>01<br>01 | 02<br>-<br>01 | -<br>-<br>- | -<br>01<br>- |
| **එකතුව** | | | | | 15 | 17 | **02** | 24 |


## 8. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

ආයතනය පරිපාලනය අංශ 2කින් සමන්විත වේ . එනම් මුදල් හා සාමාන්‍ය පාලන අංශ වේ.

| අංශය | අධි ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| මුදල් අංශය | - | 02 | 05 | - |
| සාමාන්‍ය පාලන අංශය | - | 03 | 07 | 04 |
| **එකතුව** | **-** | **05** | **12** | **04** |

## 8.1 සංවිධාන සැලැස්ම - 2014

රූප සටහන 1 - මොරටුව විශ්වවිද්‍යාලය- තාක්ෂණික ආයතනයේ ඉහල තනතුරු පෙලගැස්ම පෙන්නුම් කරයි.




රූප සටහන 1

## 9. පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර:

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් කරන ලද පර්යේෂණ කටයුතු වල සොයාගැනීම් දේශීය සහ විදේශීය වශයෙන් ඉදිරිපත් කර ඇති අතර හා ප්‍රකාශිතව ඇත.

| කතෘවරු | පර්යේෂණ පත්‍රිකාවේ මතෘකාව | සම්මේලනය / සගරා |
|---|---|---|
| ජී.කේ ජයතුංග<br>බී.එම්.ඩබ්.පී.කේ අමරසිංහ | විසිරුනු පාත්තියක බාහලන ගම්මිරිස් වියැලෙන වාලන | HETC සම්භාෂණය 2014 |
| ජී.කේ ජයතුංග<br>බී.එම්.ඩබ්.ජී.කේ අමරසිංහ | තනාගත් බටයක හැඩහුරුවෙහි බලපෑම අනුව විසිරුනු පාත්තියක බහාලන ගම්මිරිස් වියැලෙන වාලන | ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ වාර්ෂික සැසිය 2014 |
| ශිරානි එම් කන්නන්ගර, සහන් සී රණසිංහ, සුමුදු කේ කුමාරගේ, නුවන් ඩී නානායක්කාර | උදරයේ අවයව පිරික්සීමට කෙරෙන ශල්‍යකර්ම සිමුලේටරයෙහි තද ශෛල විරෝධන අතර පවතින විරාමය | 2014 IEEE කලාපීය 10 වැනි සම්භාෂණය. |
| ජී.ඩී නානායක්කාර | GSM / Pic පදනම් වු දුරස්ථ විදුලි සැර ස්ථාපිත ස්ථම්භ පරීක්ෂණ උපකරණය | මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය පර්යේෂණ සම්භාෂණය |
| මහේෂ්වරී බී, සිමොන්ස් බී, සහ තෝරදෙණිය (සම්පාදකවරුන්) | ආසන්නව පිහිටි උද්‍යාන සැකසුම් ජලය, ආහාර සහ පරිසර ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ වාර්තා | ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පැවැත්වෙන මතු සඳහන් මාතෘකාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රනය. |
| ජී.ඩබ්.ටී.සී කණ්ඩම්බි | ශ්‍රී ලංකාවේ තමන්ට සරිලන සහ ඔරොත්තු දියහැකි තරමේ නිවාස | දකුණු සහ මධ්‍ය ආසියාවේ ඉංජිනේරු සමිති සම්මේලනය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සම්මේලනයේ සටහන්. |

| කතෘවරු | පර්යේෂණ පත්‍රිකාවේ මතෘකාව | සම්මේලනය |
|---|---|---|
| කේ.එම් රණසිරි<br>ඒ.එම් මුසාතික් | අඩුපාඩු විශ්ලේෂනය, දුඹුරු පැහැති යකඩ වල අපතේ යෑම් අවම කිරීම සහ ප්‍රතිලාභ දියුණු කිරීම. | වෙළඳ විද්‍යා ඉන්දියානු ජර්නලය - වෙළුම. |
| පි.ඩි.සි කුමාර, අයි.පී.ඩබ් චන්දන, ඒ.එම් මුසාතික් සහ ටි.ආර්. ආරියරත්න | ව්‍යුහාත්මක නිර්මානවල න්‍යායාත්මක විමර්ශනය for a parabolic trough concentrator | පර්යේෂන සම්භාෂනය තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය. |
| ජේ.එම්.පී ගුණසේකර ආර්.ඒ.ආර්.සී ගෝපුර සහ ටි.එස්.එස් ජයවර්ධන | අනවශ්‍ය උඩ පුළුල් කොටස සැකිලි රොබෝවරයෙන් අක්‍රීය ලෙස ප්‍රතිචාර දැක්වීම. | 7 වන IEEE ජාත්‍යන්තර සම්මේලනය - තොරතුරු සහ ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන (ICIAFS) 2014 |
| ආර්.ඩි.බී මාවිල්මඩ, එස්.එම්.වයි දම්රුවන්, ජේ. තිබාකර්, සී.සී විජේසිරිවර්ධන, ජේ.එම්.පී ගුණසේකර සහ ආර්.ඒ.ආර්.සී ගෝපුර | නව ලිහි සහ යාන්ත්‍රනය සහිත උරහිස් සැකිල්ල | ජාත්‍යන්තර පර්යේෂණ සැසිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය IPURSE 2014 |
| සෝමරත්න එම්.සී.ඩබ් ලියනගේ එන්.එම්.වි වල්පලගේ එස්. | මතුපිට විකීරනය වූ සිලිකා සමග මහාපරිමාන අනුක ආදිය ක්‍රියාත්මක විම හරහා ගත් ස්වාභාවික රබර් කිරි. | ව්‍යාවහාරික පොලිමර් විද්‍යාව - 2014 වෙලුම 131 නිකුතුව 12 |
| සෝමරත්න එම්.සී.ඩබ් ලියනගේ එන්.එම්.වි වල්පලගේ එස්. | හයිඩ්‍රොලික් පොලිමර් සමග මතුපිට විකීරනයවූ සිලිකා සහ ශක්තිමත් කරන ලද ස්වභාවික රබර් කිරිවල බලපෑම | ජාතික විද්‍යා පදනම සඟරාව -2014 වෙලුම 42 අංක 4 |

| කතෘවරු | පර්යේෂණ පත්‍රිකාවේ මතෘකාව | සම්මේලනය | සඟරා |
|---|---|---|---|
| ජී.කේ ජයතුංග, බී.එම්.ඩබ්.බී.කේ අමරසිංහ | තාපය සහිත කලුගම්මිරිස් උදුනක වේලීම් බටයක් සහිතව හෝ රහිතව | සිවිල්, ව්‍යුහයන් සහ යාන්ත්‍රික ඉංජිනේරු ACSME 2014 | නිෂ්පාදන සහ කාර්මික ජාත්‍යන්තර සගරාව වෙලුම 1 නිකුතුව 2 පිටු 6-10 ප්‍රකාශන දිනය 2014 ජුනි 25 |
| ජී.ඩබ්.ටී.සි කණ්ඩම්බි | තනිතට්ටු නිවසක් සඳහා සිමෙන්ති සංයෝජිත සිහින් වැලි භාවිතය | ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ වාර්ෂික සැසිය 2014 ඔක්තෝබර් | ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සගරාව 2014 ඔක්තෝබර්. |

## 10. වැඩසටහන්, සම්මන්ත්‍රන සහ වැඩමුළු පිළිබඳ විස්තර:

1. අගැයීම් ක්‍රමවේදයන් පිළිබද එක්දින වැඩමුළුවක්, මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ සියළුම අධ්‍යයන කාර්යය මණ්ඩලයට මහාචාර්ය ජවුෆර් විසින් 2014 ජනවාරි මස පවත්වන ලදී.

2. මොරටුව විශ්වවිද්‍යාලය තාක්ෂණික ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කිරීම පහසු කිරීම සඳහා, දෙවන වාර්ෂික පර්යේෂණ සම්භාෂණය 2014 ජුලි 03 දින පවත්වන ලදී.

3. SLS පුහුණු අංශය විසින් ISO 9001-2008 පිළිබදව සියළු අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය වෙත, දෙදින වැඩමුළුවක් 2014 ජුලි 08 සහ 09 දිනයන්හිදී පවත්වන ලදී.

4. “වැඩෙහි යෙදී සිටියදී සතුටෙන් සිටිය හැක්කේ කෙසේද” යන්න පිළිබදව නේවාසික වැඩමුළුවක්, මොහාන් පල්ලියගුරු දිරිගැන්වීමේ කථිකයා විසින්, මොරටුව විශ්වවිද්‍යාල තාකෂණික ආයතනයේ සියළුම කාර්ය මණ්ඩලය සඳහා 2014 අගෝස්තු මස පවත්වන ලදී.

5. මොරටුව විශ්වවිද්‍යාලය, තාක්ෂණික ආයතනයේ ශිෂ්‍යයන්ගේ ආකල්ප වෙනස් වීම් පිළිබදව “Be a Brand”නැමැති වැඩසටහන, ඔවුන්ගේ සමාජයීය වගකීම් පිළිබද දැනුවත් කිරීම සඳහා, මොහාන් පල්ලියගුරු මහතා විසින් 2014 ඔක්තෝබර් 12 සහ 19 දෙදින තුල පවත්වන ලදී.

6. මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ සියළුම කාර්ය මණ්ඩලය සඳහා “විභාග කටයුතු ” පිළිබදව එක්දින කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහනක් මහාචාර්ය දයාවංශ මහත්මිය විසින් 2014 නොවැම්බර් 20 දින පවත්වන ලදී.

7. එන්.ඩී.ටී සිවිල් ඉංජිනේරු ශිෂ්‍යයින් සඳහා වාර්ෂික මිණුම් කඳවුර 2014 දෙසැම්බර් මස කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලදී.

## 11. ලබාගත් ප්‍රදාන පිළිබඳ විස්තර :

ඩිප්ලෝමා ප්‍රදාන උත්සවයේදී සිසුන් 26 දෙනෙකු විශිෂ්ය සමාර්ථ සහතික ලබාගන්නා ලදී.

| | |
|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණය | 04 |
| විදුලිය ඉංජිනේරු තාක්ෂණය | 07 |
| විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය | 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය | 02 |
| නාවුක අධ්‍යයන තාක්ෂණය | 06 |
| පොලිමර් තාක්ෂණය | 02 |
| පේෂකර්ම හා රෙදිපිලි තාක්ෂණය | 03 |

## 12. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර :

තාක්ෂණික ආයතනය දියගම ස්ථාපිත කිරීමෙන් පසු නව පාඨමාලා ආර්මභ කිරීමට යෝජිතය.

## 13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තරය :

රු.පි.'000

| වැය විෂයය | 2013 (රුපියල්) | 2014 (රුපියල්) |
|---|---|---|
| පෞද්ගලික වේතන වියදම් | 78,547,461 | 93,526,6880 |
| ගමන් වියදම් | 295,725 | 86,103 |
| සැපයීම් වියදම් | 3,361,033t | 3,960,105 |
| නඩත්තු වියදම් | 1,142,909 | 2,549,932 |
| ගිවිසුම්ගත සේවා වියදම් | 4,012,654 | 3,832,023 |
| වෙනත් | 12,942,349 | 9,341,455 |
| **එකතුව** | **100,302,131** | **113,296,498** |

## 14. මූලධන වියදම් පිළිබඳ විස්තර :

රු.පි.'000

| වැය විෂයය | 2013 (රුපියල්) | 2014 (රුපියල්) |
|---|---|---|
| ඒ. දැවභාණ්ඩ, රසායනාගාර සහ කාර්යාල උපකරණ | 7,562,162 | 7,825,841 |
| බී. යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම් | 11,000 | 5,900 |
| සී. ගොඩනැගිලි සහ ව්‍යුහයයන් (දියගම) | - | 245,322 |
| ඩී. වෙනත් (ග්‍රන්ත) | 647,027 | 756,950 |
| **එකතුව** | **8,220,189** | **8,834,013** |

## 15. ව්‍යාපෘති විස්තරය (දේශිය / විදේශිය ප්‍රතිපාදන)

| නම සහ විස්තර | ණය/ ප්‍රතිපාදන | ප්‍රතිපාදන ආයතනය | TCE රු. | RFA රු. | DF රු. |
|---|---|---|---|---|---|
| තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය ප්‍රතිස්ථාපනය කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | ණය | ශ්‍රී ලංකා රජය | මිලියන 10,239 | | |
| **එකතුව** | | | **මිලියන 10,239** | | |

#(ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව /ජාත්‍යන්තර සංවර්ධන ආයතනය/ ලෝක බැංකුව)

## 16. ව්‍යාපෘති වැය විස්තරය (දේශීය / විදේශීය අරමුදල් ප්‍රතිපාදනය)

රුපි.'000

| නම | මුළු පිරිවැය (රු.) | 2013 වැය; (රු.) | 2014 වැය (රු.) | 2014.12.31 දිනට මුළු වියදම | භෞතික දියුණුව % |
|---|---|---|---|---|---|
| තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය ප්‍රතිස්ථාපනය කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | | 14,309,862 | 7,879,766 | 26,829,240.13 | |
| **එකතුව** | | **14,309,862** | **7,879,766** | **26,829,240.13** | |

## 17. මූල්‍ය ප්‍රගති විස්තරය (වියදම්)

රුපි'000

| විෂයය | 2014 ප්‍රතිපාදන | 2014 වියදම | ඉතිරිය / අතිරික්ත වැය රුපියල් |
|---|---|---|---|
| ඒ. ව්‍යාපෘති වැය හැර පුනරාවර්තන වැය | 110,280,000 | 113,296,498 | ( 3,016,498 ) |
| බි. ව්‍යාපෘති වැය හැර මූලධන වැය | 7,000,000 | 8,834,013 | ( 1,834,013 ) |
| සී. ව්‍යාපෘතිය - දේශිය අරමුදල් | | | |
| ඩී. ව්‍යාපෘතිය - විදේශිය ප්‍රතිපාදන | | | |
| **එකතුව** | **117,280,000** | **122,130,511** | **(4,850,511 )** |

## 18. මූල්‍ය ප්‍රගති විස්තරය (උත්පාදන)

රුපි'000

| අදායම් ප්‍රභවය | 2014 ප්‍රතිපාදන රුපි. | 2014 එකතු කිරීම් රුපි. | ඌනතාවය / අතිරික්තය රුපි. |
|---|---|---|---|
| ඒ. උපාධි අධ්‍යයනය | | | |
| බී. පශ්චාත් උපාධි අධ්‍යයනය | | | |
| සී. උපදේශන සේවා | | | |
| ඩී. වෙනත් | 3,647,000 | 3,854,802 | ( 207,802 ) |
| **එකතුව** | **3,647,000** | **3,854,802** | **(207,802 )** |

## 19 මුල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2014

රුපි.'000

| විෂයය | සූත්‍රය | ඒක ශිෂ්‍ය වියදම |
|---|---|---|
| ඒ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන වැය (ආර්/ ඊ) | ප්‍ර. වැය ශිෂ්‍ය සංඛ්‍යාව | 110,641.11 |
| බී. ඒක ශිෂ්‍ය මුලධන වැය (සීඊ) | මු. වැය ශිෂ්‍ය සංඛ්‍යාව | 8,626.97 |
| | | |
| මුළු මුදල | | **119,268.08** |

## 20 2014 වර්ෂයේදී ලැබුනු යටිතල පහසුකම් විස්තර

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය 2000 වර්ෂයේ සිට මොරටුව විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් උපයෝගී කර ගනී .

## 21 වෙනත් විස්තර / මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රගතිය

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ ගොඩනැගිලි ප්‍රතිස්ථාපනය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ආරම්භක රැස්වීම, උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ නිළධාරීන්, අයි.සී.සී නිළධාරීන්, මොරටුව විශ්වවිද්‍යාල සහ මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ නිළධාරීන් සහිතව 2014 ඔක්තෝබර් මස පවත්වන ලදී.

යුරෝපීය නාවුක ආරක්ෂක ඒජන්සිය (EMSA) පවත්වන ලද විගණන නාවුක අධ්‍යයන වැඩසටහන් දෙකෙහිදීම (නාවික ඉංජිනේරු සහ නාවුක අධ්‍යයනය) මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය සාර්ථක ප්‍රතිඵල ලැබීය.

## තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය

## 2014 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| වත්කම් | සටහන් | 2014 (රුපි) | 2014 (රුපි) | 2013 (රුපි) | 2013 (රුපි) |
|---|---|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | | | |
| බැංකුවේ ඇති මුදල් | 1 | 5,210,484 | | 3,950,953 | |
| ලැබිය යුතු දෑ | 2 | 10,278,021 | | 11,817,820 | |
| තොගය | | 1,006,464 | | 905,686 | |
| පෙර ගෙවීම් | | 253,976 | | 209,854 | |
| අයෝජන (කෙටිකාලීන) | | 5,000,000 | 21,748,945 | 18,000,000 | 34,884,313 |
| ලැබිය යුතු ආරක්ෂක තැන්පතු | | | 2,391,200 | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| අයෝජන (දිගුකාලීන) | 3 | 15,323,815 | | | |
| දේපල පිරියත හා උපකරණ | 4 | 59,325,188 | | | |
| කෙරිගෙන යන වැඩ | 4(a) | 24,438,040 | | | |
| වෙනත් වත්කම් | 5 | 1,618,411 | | | |
| | | | 100,705,454 | | 93,720,881 |
| **මුළු වත්කම්** | | | **124,845,599** | | **128,605,194** |
| **බැරකම්** | | | | | |
| ජංගම බැරකම් | | | | | |
| ගෙවිය යුතු දෑ | 6 | 3,344,092 | | 5,666,973 | |
| අත්හිටවූ අදායම් | 7 | 74,307 | | 38,094 | |
| උපචිත වියදම් | 8 | 2,354,998 | 5,773,397 | 4,548,145 | 10,253,212 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | | | 16,170,790 | | 15,532,956 |
| මුළු බැරකම් | | | (21,944,187) | | (25,786,168) |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **102,901,412** | | **102,819,026** |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | | | |
| වැයවූ මූලධන ආධාර | 9 | 27,104,514 | | 31,442,352 | |
| කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධන ගිණුම | 9(a) | 51,829,240 | | 37,784,571 | |
| වැයනොවූ මූලධන ආධාර | 10 | 5,905,870 | | 15,469,651 | |
| පොදු සංචිතය | 11 | (12,850,304) | | (13,772,390) | |
| පරිත්‍යාග | 12 | 4,093,286 | | 3,975,000 | |
| මූල්‍ය නොවන රාජ්‍ය දීමනා | 13 | 7,250,000 | | 7,250,000 | |
| ඒකරාශි වූ අරමුදල | 14 | 19,568,806 | | 20,669,842 | |
| | | | 102,901,412 | | 102,819,026 |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | | **102,901,412** | | **102,819,026** |

පිටු 35 සිට 38 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශන වලට අයත් කොටසකි. මෙම මුදල් ප්‍රකාශන පිළියෙල කිරීමෙන් ඉදිරිපත් කිරීමක් කළමනාකරන මණ්ඩලයේ වගකීම් වේ. ආයතනයේ කළමනාකරන මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලද්දේ:-

| | | |
|---|---|---|
| අක/ එම්.එම්.පී.ඩී සමරසේකර මිය | අක/ එස්.පී.ඩී පිරිස් මිය | අක/එස්.ආර්.එස් උදේෂි මිය |
| අධ්‍යක්ෂතුමිය | ජ්.ස මූල්‍යාධිකාරී | වැ.බ.නියෝජ්‍ය ලෙඛකාධිකාරී |

**තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය**
**2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| **මෙහෙයුම් අදායම** | සටහන | 2014(රුපි) | 2013(රුපි) |
|---|---|---|---|
| පුනරාවර්තන ආධාර | | 110,280,000 | 101,300,000 |
| රජයේ ආධාර - මහපොළ | | 2,396,600 | 2,585,000 |
| රජයේ ආධාර - ශිෂ්‍යාධාර | | 13,412,700 | 10,976,000 |
| වෙනත් අදායම් | 15 | 3,854,802 | 2,420,958 |
| ක්‍රමක්ෂය | | 6,882,136 | 6,546,884 |
| පර්යේෂණ දිරිගැන්වීමේ ආධාර | | 150,000 | 0 |
| | | **136,976,238** | **123,828,842** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පෞද්ගලික වැටුප් හා වේතන | 16 | 93,526,880 | 78,547,461 |
| ගමන් වියදම් | 17 | 86,103 | 295,725 |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | 18 | 3,960,105 | 3,361,033 |
| නඩත්තු කිරීමේ වියදම් | 19 | 2,549,932 | 1,142,909 |
| ගිවිසුම් සේවා | 20 | 3,832,023 | 4,012,654 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 21 | 725,340 | 614,028 |
| කාලය සහ ක්‍රමක්ෂය වියදම් | | 7,677,136 | 6,546,884 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 22 | 9,341,455 | 12,942,349 |
| මහපොළ | | 2,396,600 | 2,585,000 |
| ශිෂ්‍යාධාර | | 13,412,700 | 10,976,000 |
| පර්යේෂණ දිරිගැන්වීමේ වියදම් | | 150,000 | 0 |
| මුළු මෙහෙයම් වියදම් | | **137,658,274** | **121,024,043** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවුනු අතිරික්තය / ඌනතාවය | | **(682,036)** | **2,804,799** |

අක / එස්.පී.ඩී පීරිස් මිය
ජ්‍යෝෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

## තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
## 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන | 9 | 9a | 10 | 11 | 12 | 13 | 14 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැයවූ මූලධන ආධාර | ඉඩම සඳහා ගෙවීම් | වැයනොවූ මූලධන ආධාර | පොදු සංචිතය | පරිත්‍යාග | මුදල් නොවන රජයේ ආධාර | එක්රැස්වූ අරමුදල | මුළු මුදල |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 30,998,880 | 30,286,444 | 26,675,468 | (17,939,735) | 3,975.000 | 7,250,000 | 14.495,254 | 95,741,311 |
| මූල්‍ය ප්‍රගති ප්‍රකාශනයන්හි සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු | | | | | 1,362,546 | | | | 1,362,546 |
| මාරු කිරීම් / ශුද්ධ චලනයන් | | 8,257,690 | 7,498,127 | (11,205,817) | | | | 6,174,588 | 10,724,588 |
| කාල සීමාව තුල අතිරික්තය / ඌනතාවය | | | | | 2,804,799 | | | | 2,804,799 |
| ක්‍රමක්ෂය | | (7,814,218) | | | | | | | (7,814,218) |
| **2013 දෙසැම්බර් දිනට ශේෂය** | | **31,442,352** | **37,784,571** | **15,469,651** | **13,772,390** | **3,975.000** | **7,250,000** | **20,669,842** | **102,819,026** |
| දේපල ප්‍රත්‍යාගනනයෙන් පසු අතිරික්තය / ඌනතාවය | | | | | | | | | 0 |
| මාරුකිරීම් ශුද්ධ චලනයන් | | 9,499,033 | 7,232,934 | (9,563,781) | 1,604,122 | 118,286 | | -1,101,036 | 6,185,436 |
| මූල්‍ය ප්‍රගති ප්‍රකාශනයන්හි සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු | | (7,749,735) | 6,811,735 | | | | | | (938,000) |
| ක්‍රමක්ෂය | | (6,087,136) | | | | | | | (6,087,136) |
| අදාල කාලය සඳහා අතිරික්තය / ඌනතාවය | | | | | (682,036) | | | | (682,036) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **27,104,514** | **51,829,240** | **5,905,870** | **(12,850,304)** | **4,093,286** | **7,250,000** | **19,568,806** | **102,901,412** |

## තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
## 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සටහන

| මෙහෙයුම් ක්‍රියාකාරීත්වයන් තුල මුදල් ප්‍රවාහයන් | සටහන් | | 2014 | | 2013 |
|---|---|---|---|---|---|
| | | රුපි | රුපි | රුපි | රුපි |
| අතිරික්තය / ඌනතාවය සාමාන්‍ය ක්‍රියාකාරීත්වය තුලින් | | (682,036) | | 2,804,799 | |
| <u>මුදල් නොවන සංචලනය</u> | | | | | |
| ක්ෂය වීම් | | 7,677,136 | | 6,546,884 | |
| ක්‍රමක්ෂය | | (6,882,136) | | (7,813,051) | |
| අතිරික්තය / (ඌනතාවය) පාරිතෝෂික වෙන්කිරීම් | | 637,834 | | 3,557,939 | |
| වෙනත් ගැලපීම් | 24 | 2,401,208 | | 1,362,546 | |
| <u>අතිරික්තය / (ඌනතාවය) කාරක ප්‍රාග්ධනය</u> | | | | | |
| (ඌනතාවය / අතිරික්තය) ලැබීම් | 25 | 1,394,898 | | (6,263,887) | |
| අතිරික්තය / (ඌනතාවය) අත්හිටවූ ආදායම | | 36,213 | | 2,139,329 | |
| අතිරික්තය / (ඌනතාවය) ගෙවීම් | | (2,322,881) | | 1,001,385 | |
| (ඌනතාවය) / අතිරික්තය උපචිත වියදම් | | (2,193,147) | | 1,517,914 | |
| මෙහෙයුම් ක්‍රියාවන් තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 67,089 | | 575,200 |
| <u>ආයෝජන මුදල් ප්‍රවාහය</u> | | | | | |
| යාන්ත්‍රෝපකරන සහ උපකරණ මිලදී ගැනීම් (උපලේඛන ඩී සහ ඊ) | | (8,944,013) | | (8,257,690) | |
| ඉඩම් සඳහා ගෙවීම් (ප්‍රාග්ධන) | | (7,879,766) | | (7,498,127) | |
| | | | (16,823,779) | | (15,755,817) |
| <u>මුල්‍යමය ක්‍රියාකාරකම් තුල මුදල් ප්‍රවාහය</u> | | | | | |
| මුලධන ආධාර | 10 | 7,000,000 | | 4,810,000 | |
| අතිරික්තය / ඌනතාවය විශේෂිත අරමුදල් | | (1,101,036) | | 6,174,588 | |
| අතිරික්තය / ඌනතාවය ආධාර | | 118,286 | | | |
| මුල්‍ය කටයුතු තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 6,017,250 | | 10,984,588 |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) මුදල් සහ මුදල් සමතාව | | | (10,739,440) | | (4,196,029) |
| අදාල කාලය ආරම්භයේ මුදල් සහ මුදල් සමතාව | | | 36,273,739 | | 40,469,768 |
| අදාල කාලය අවසානයේ මුදල් සහ මුදල් සමතාව | 27 | | 25,534,299 | | 36,273,739 |

අක / එස්.පී.ඩී පීරිස් මිය
ජ්‍යෝෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී

## 2014 වර්ෂය තුල ඉටුකෙරුනු අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ වාර්තාව

විගණකාධිපතිගේ එකගත්වය ඇතිව, වැදගත් කේෂත්‍ර ආවරණය වන පරිදි විගණන කොමිටුවේ සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලත් 2014 වර්ෂය සඳහා වූ වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව, පහත සඳහන් ආකාරයට මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ විගණන කටයුතු, අභ්‍යන්තර විගණන අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

1 පූර්ව විගණනය

- විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම (යූ.පි.එෆ්)
- පාරිතෝෂික දීමනා ගෙවීම්.
- විශ්‍රාම අරමුදල් නිදහස් කිරීම.
- බැදුම්කර ගණනය කිරීම.

2 සොයා ගැනීම් මත නිදහස් කරන ලද විගණන විමසීම්.

- ශිෂ්‍යාධාර ගෙවීම් සමීක්ෂණය කිරීම
- ගෙවීම් වවුචර් නියැදි ලෙස පරීක්ෂා කිරීම

3 ක්‍රියාත්මක කරන ලද වෙනත් විගණන පරීක්ෂණ

- මිලදී ගැනීම් ඇනවුම් නියැදි ලෙස පරීක්ෂා කිරීම.
- බැංකු සැසදුම් සටහන් පරීක්ෂා කිරීම.
- විවිධ අත්තිකාරම් පරීක්ෂා කිරීම.

4 විගණන කමිටුව

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ විගණන කොමිටුව, තෙමසකට වරක්වත් ආයතනයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා රැස්වෙයි. මෙම කොමිටුව විගණන වාර්තා මෙන්ම ඔඩියර් ජෙනරාල් විසින් යොමු කරනු ලබන විගණන විමසීම් පිළිබඳ තාක්ෂණික ආයතනයේ ප්‍රති පිළිතුරු සලකා බලනු ලැබේ. කොමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලබන අතර වරද නිවැරදි කිරීම් පිණිස මග පෙන්වීම් ලබාදෙන අතර ඒවා අධීක්ෂණයද කරනු ලැබේ.

විගණන කොමිටිය සමාලෝචනයට යොමුවන වර්ෂය තුල තෙවරක් රැස්වී ඇත.

5 කාර්යය මණ්ඩලය

- ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණන නිළධාරී
- විගණන සහායක
- ලිපිකරුවන් දෙදෙනෙක්
- පරිගණක යෙදවුම් සහකාර 1
- කම්කරු තනතුර 1

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : ඊයි/ඩී/අයිටීයූඑම්/1/14/02 | ඔබේ අංකය / உமது இல. / Your No. : | දිනය / திகதி / Date : 2015 අගෝස්තු 31 දින

අධ්‍යක්ෂ,

තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය.

**මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2015 ජුනි 23 වන දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වටිනාකම ශූන්‍ය අගයක් වූ දැනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු.46,379,016 ක් වූ දේපල පිරියත උපකරණවල සාධාරණ අගය පිළිබිඹු නොවන බැවින් එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වැනි වගන්තිය අනුව උසස් අධ්‍යාපන ආයතන විසින් කුමන ප්‍රභවයකින් හෝ උපයනු ලබන සියළුම ආදායම් එම ආයතනයේ අරමුදලට බැරකල යුතු බව නියම කර තිබියදී එයට පටහැනිව ප්‍රෙපරටරි (Preporatory) පාඨමාලා ආදායම් සහ ජාතික තාක්ෂණික පාඨමාලා අයදුම්පත් ආදායම් වෙනම විලම්භිත ආදායම් ගිණුම්වල බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මෙම ගිණුම්වලින් රු.933,634 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවකයන් අතර බෙදා දී තිබූ අතර මෙම ගෙවීම සඳහා උපදේශක සේවා භාරගැනීම සඳහා වූ රාජ්‍ය මුදල් අංක 380 චක්‍රලේඛය වැරදි සහගත ලෙස අර්ථකථනය කර තිබුණි.

## 2.3 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය අනුව ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛණවල සටහන් කළ යුතු නමුත් එයට පටහැනිව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.50,922,656 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.682,036 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,804,799 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,486,835 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන රු.8,980,000 කින් වැඩිවී තිබුණද, කාර්යමණ්ඩල පාරිශ්‍රමික රු.14,979,419 කින් වැඩිවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ඩිප්ලෝමා පාඨමාලා 09 ක් පවත්වනු ලබන අතර 2010 වර්ෂයේදී ඩිප්ලෝමා සඳහා බඳවා ගත් ශිෂ්‍යයින් 360 කින් සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයින් 283 ක් හෙවත් සියයට 79 ක් සමත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.137,658,274 ක් වීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය රු.202,737 ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මහපොළ ශිෂ්‍යත්ව ආධාර වශයෙන් ශිෂ්‍යයින් 206 කට රු.2,396,600 ක් ගෙවා තිබූ අතර ශිෂ්‍යාධාර වශයෙන් ශිෂ්‍යයින් 428 කට රු.13,412,700 ක් ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන සති 30 ක් තුළ දේශන පැය 20,999 ක් පවත්වා තිබූ අතර ඉන් සියයට 48 ක් අධ්‍යයන අවශ්‍යතා මත බාහිර දේශකවරුන් මගින් දේශන පවත්වා තිබුණි. අභ්‍යන්තර දේශන පැය 10,925 ක වියදම හා බාහිර දේශන පැය 10,074 ක වියදම පිළිවෙලින් රු.50,922,656 ක් හා රු.14,246,700 ක් වී තිබුණි.

## 4.2 අරමුදල් ඌන උපයෝජනය

වෙළඳ නාවික නිලධාරීන් පුහුණු වැඩසටහන සහ සමුද්‍ර ඉංජිනේරු හා නාවික ඉංජිනේරු අරමුදලේ වටිනාකම වන රු.7,970,715 ක් අදාල අරමුණුගත කාර්යයන්ට නොයොදා වසර 10 ක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආධුනික කථිකාචාර්ය තනතුරු 15 ක් හා අනෙකුත් කාර්ය මණ්ඩලයට අදාල මාණ්ඩලික නොවන තනතුරු 12 ක් පුරප්පාඩුව පැවතුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

2011 සිට 2015 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද ඒ සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය විගණිත දිනය දක්වා ලබාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) උපයෝගී ලේඛණ

(ඇ) සේවක ණය පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) අත්තිකාරම්

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| **2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | **2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** |
| **2.2.1 ගිණුම්කරණ අඩුපාඩු** | **2.2.1 ගිණුම්කරණ අඩුපාඩු** |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වටිනාකම ශූන්‍ය අගයක් වූ දැනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු. 46,379,616 ක් වූ දේපල පිරියත උපකරණවල සාධාරණ අගය පිළිබිඹු නොවන බැවින් එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2014-12-31 වන දිනට අවසන් කරන ලද වත්කම් සමීක්ෂණය පිළිබද වාර්තා සැලකිල්ලට ගනිමින් පාවිච්චියට නුසුදුසු වත්කම් බැහැර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කොට ඇත. මෙම බැහැර කිරීමේ ලැයිස්තු පිළියෙළ කල වහාම ඉතිරි වත්කම් පිළිබද ලැයිස්තු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ප්‍රත්‍යාගණනය ඇරඹීමට නියමිත බව දන්වනු කැමැත්තෙමි. |
| **2.2.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු** | **2.2.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු** |
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වැනි වගන්තිය අනුව උසස් අධ්‍යාපන ආයතන විසින් කුමන ප්‍රභවයකින් හෝ උපයනු ලබන සියළුම ආදායම් එම ආයතනයේ අරමුදලට බැරකල යුතු බව නියම කර තිබියදී එයට පටහැනිව ප්‍රෙපරටරි (Preporatory) පාඨමාලා ආදායම් සහ ජාතික තාක්ෂණික පාඨමාලා අයදුම්පත් ආදායම් වෙනම විලම්භිත ආදායම් ගිණුම්වල බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මෙම ගිණුම් වලින් රු. 933,634 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවකයන් අතර බෙදා දී තිබූ අතර මෙම ගෙවීම් සඳහා උපදේශක සේවා භාරගැනීම සඳහා වූ රාජ්‍ය මුදල් අංක 380 චක්‍රලේඛය වැරදි සහගත ලෙස අර්ථකථනය කර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 (2010-01-18) සහ එම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමට මොරටුව විශ්වවිද්‍යාලයීය පාලක සභාව ගත් තීරණය අනුගමනය කරමින් තාක්ෂණික ආයතනයේ කළමනාකරණ මණ්ඩලය එහි 2008-08-29 දිනැති 93 වන රැස්වීමේදී අනුමත කරන ලද දීමනා ගෙවීම් ක්‍රියාපටිපාටියට අනුකූලව 2014 වර්ෂය තුලදී පැවැත්වූ ප්‍රෙපරටරි (Preporatory) පාඨමාලාවේ ආදායම් සහ ජාතික තාක්ෂණික පාඨමාලා අයදුම්පත් ආදායම් වලින් පමණක් වියදම් දරා ඇත. |

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම | 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය අනුව ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛණවල සටහන් කළ යුතු නමුත් එයට පටහැනිව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු. 50,922,656 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල පද්ධතිය අනුගමනය කරන ක්‍රමවේදයම තාක්ෂණික ආයතනයටද අදාල විය යුතු වේ. මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් පරිදි කටයුතු කර ඇත. |
| 3. මූල්‍ය සමාලෝචනය | 3. මූල්‍ය සමාලෝචනය |
| 3.1 මූල්‍ය ප්‍රතිඵල | 3.1 මූල්‍ය ප්‍රතිඵල |
| ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 682,036 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,804,799 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,486,835 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන රු. 8,980,000 කින් වැඩිවී තිබුණද, කාර්යමණ්ඩල පාරිශ්‍රමික රු. 14,979,419 කින් වැඩිවීම මෙම පිරිහිම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | එකග වෙමි. |

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| 4. මෙහෙයුම් සමාලෝචනය | 4. මෙහෙයුම් සමාලෝචනය |
| 4.1 කාර්යසාධනය | 4.1 කාර්යසාධනය |
| පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) ආයතනය විසින් ඩිප්ලෝමා පාඨමාලා 09 ක් පවත්වනු ලබන අතර 2010 වර්ෂයේදී ඩිප්ලෝමා සඳහා බදවාගත් ශිෂ්‍යයින් 360 කින් සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයින් 283 ක් හෙවත් සියයට 79 ක් සමත් වි තිබුණි. | (අ) පෞද්ගලික හේතුන් මත සිසුන් කිහිපදෙනෙක් පාඨමාලාව හැර යති. නාවික ඉංජිනේරු ක්ෂේත්‍රයේ සිසුන් දිවයිනෙන් බැහැරව පුහුණුව සහ රැකියා වල නිරත වීම නිසා ඩිප්ලෝමා ප්‍රධානෝත්සවයට සහභාගි වීම වසර කිහිපයකින් වෙනස් විය හැකිය.<br><br>ශිෂ්‍යයින් පළවන වසර සහ දෙවන වසර අවසානයේ පවත්වන විභාගවලදී යම් විෂයයන් සංඛ්‍යාවක් අසමත් වූ විට එම විභාගය අසමත් ලෙස සලකනු ලබයි. සමහර සිසුන් බාහිර පුහුණුව අවසානයේදී පවත්වන පරීක්ෂණයෙන් අසමත් වෙති. පළවන වසර දෙවන වසර විභාග සහා බාහිර පුහුණුව සාර්ථකව නිම කරන සිසුන් පමණක් ඩිප්ලෝමාව ලබා ගැනීමට සුදුසුකම් ලබති.<br><br>තවද 2013 ජනවාරි මස සිදු වූ සිසු ගැටුම් හේතුවෙන් 2010 වසරේ බදවා ගත් සිසුන් 17 දෙනෙකු අවසන් විභාගයට සහ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට සුදුසුකම් නොලැබීම නිසා මෙම අගය අඩුවී ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.137,658,274 ක් වීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 202,737 ක් වී තිබුණි. | (ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රුපියල් 137,658,274 කි. ඒක ශිෂ්‍ය පිරිවැය 134,170 ලෙස නිවැරදි විය යුතුය. එන්.ඩී.ටී පාඨමාලාව තුන් අවුරුදු පාඨමාලාවක් නිසා තුන් වන වසර සිසුන්ද ඇතුළුව ඒක ශිෂ්‍ය පිරිවැය ගණනය කල යුතු වේ. |

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
| --- | --- |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුල මහපොළ ශිෂ්‍යත්ව ආධාර වශයෙන් ශිෂ්‍යයින් 206 කට රු.2,396,600 ක් ගෙවා තිබූ අතර ශිෂ්‍යාධාර වශයෙන් ශිෂ්‍යයින් 428 කට රු.13,417,700 ක් ගෙවා තිබුණි. | (ඇ) එකග වෙමි. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන සති 30 ක් තුළ දේශන පැය 20,999 ක් පවත්වා තිබූ අතර ඉන් සියයට 48 ක් අධ්‍යයන අවශ්‍යතා මත බාහිර දේශකවරුන් මගින් දේශන පවත්වා තිබුණි. අභ්‍යන්තර දේශන පැය 10,925 ක වියදම හා බාහිර දේශන පැය 10,074 ක වියදම පිළිවෙලින් රු.50,922,656 ක් හා රු. 14,246,700 ක් වී තිබුණි. | (ඈ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සහ කථිකාචාර්යවරුන් රදවා තබාගැනීම විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට පොදු ගැටළුවකි. තාක්ෂණික ආයතනයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 44 ක් වුවද මොරටුව විශ්වවිද්‍යාලයේ සම්පත් බෙදා ගනිමින් සීමිත ඉඩකඩක කටයුතු කිරීමට තාක්ෂණික ආයතනයට සිදුවීම නිසා එම කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් පිරවීම තාක්ෂණික ආයතනයට ගැටළුවක් පවතී. එම නිසා බාහිර දේශකවරුන්ගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය වී ඇත. |
| 4.2 අරමුදල් ඌන උපයෝජනය | 4.2 අරමුදල් ඌන උපයෝජනය |
| වෙළඳ නාවික නිළධාරීන් පුහුණු වැඩසටහන සහ සමුද්‍ර ඉංජිනේරු හා නාවික ඉංජිනේරු අරමුදලේ වටිනාකම වන රු. 7,970,715 ක් අදාල අරමුණුගත කාර්යයන්ට නොයොදා වසර 10 ක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | මෙම මුදල් ලැබී ඇත්තේ බාහිර ක්‍රියාකාරකම් සඳහා නොවන බව දන්වන අතර යාන්ත්‍රික ඉංජිනේරු, නාවික හා චලන අධ්‍යයන අංශයේ සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා වරාය හා නාවුක අමාත්‍යංශය මගින් මොරටුව විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබූ එම අරමුදල් 2005 වසරේ දී මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක සභා පත්‍රිකා අංක 293:66 මගින් තාක්ෂණික ආයතනය වෙත පවරා දෙන ලදී. එම අරමුදල් යාන්ත්‍රික ඉංජිනේරු, නාවික හා චලන අධ්‍යයන අංශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ස්ථාවර තැන්පත් යටතේ ආයෝජනය කර ඇති අතර තාක්ෂණික ආයතනය දියගම පරිශ්‍රය තුළ ස්ථාපිත කළ වහාම එම අධ්‍යයන අංශයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම හා අනෙකුත් සංවර්ධන කටයුතු සිදු කිරීමටත් කටයුතු කරන බව දන්වන අතර දැනට එම ආයෝජන පොළී මගින් එම අධ්‍යයන අංශයේ සමහර සංවර්ධන කටයුතු කරගෙන යනු ලබන බව දන්වනු කැමැත්තෙමි. |

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය | 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය |
| 2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආධුනික කථිකාචාර්ය තනතුරු 15 ක් හා අනෙකුත් කාර්ය මණ්ඩලයට අදාල මාණ්ඩලික නොවන තනතුරු 12 ක් පුරප්පාඩුව පැවතුණි. | තාක්ෂණික ආයතනය වසර 2000 සිට මොරටුව විශ්වවිද්‍යාලය සමග සම්පත් බෙදා ගනිමින් වසරකට ශිෂ්‍යයින් 1050 ක ප්‍රමාණයක වැඩ කටයුතු පරිපාලනය කරනු ලබයි. පසුගිය වසර කිහිපයේ සිට මොරටුව විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා සිසුන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවීම හේතුවෙන් තාක්ෂණික ආයතනයට ලබා දී තිබූ ඉඩකඩ ප්‍රමාණයද ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. එවැනි පසුබිමක අධ්‍යයන හෝ අනෙකුත් කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමේදී බඳවාගන්නා කාර්ය මණ්ඩලයට ප්‍රායෝගිකව ලබාදිය හැකි ඉඩකඩ සහ පහසුකම් පිළිබඳ ප්‍රශ්නයක් පැන නගින නිසා එම පුරප්පාඩු පිරවීම දිගින් දිගටම ආයතනයට ගැටළුවක් වී ඇත. |
| 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය | |
| 5.1 සංයුක්ත සැලැස්ම | 5.1සංයුක්ත සැලැස්ම |
| 2011 සිට 2015 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද ඒ සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය විගණිත දිනය දක්වා ලබාගෙන නොතිබුණි. | වසර 2011 සිට වසර 2015 කාලය දක්වා සංයුක්ත සැලැස්මක් තාක්ෂණික ආයතනය විසින් පිළියෙළ කර ඇත. ඒ මත පදනම්ව 2014 වර්ෂය සඳහා පිළියෙල කල ක්‍රියාකාරි සැලැස්ම සඳහා 2014-06-27 වන දින පැවති 163 වන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. |

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| 6. පද්ධති හා පාලනය | 6. පද්ධති හා පාලනය |
| (අ) ගිණුම්කරණය | (අ) ගිණුම්කරණය |
| | මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී 1978 අංක 16 දරණ පනතේ අංක 106(1), 107(1B) වගන්තියද 1985 අංක 07 දරණ සංසෝධිත පනත හා 2000 අංක () දරණ තාක්ෂණික ආයතන නියමාවලියේ අංක 19 වගන්ති (1), (2), සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ ඡේද අංක 8(3) 12 හි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල් චක්‍රලේඛ ලිපි අංක 3/2014 හා වරලත් ගණකාධිකාරි ආයතනය මිගින් නිකුත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් සැලකිල්ලට ගෙන එම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව 2015 පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ) උපයෝගී ලේඛණ | (ආ) උපයෝගී ලේඛණ |
| | මුදල් පොත්, වැය ලෙජර් හා ජ’නල් සටහන් ආදී ලේඛන වල අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) සේවක ණය | (ඇ) සේවක ණය |
| | අපගේ පාලනයෙන් තොරව සිදුවන කාර්යයන් හැර සේවක ණය ගෙවීම් හා අයවීම් අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රමයක් ආයතනය සතුව ඇත. |

| විගනන මතය | පැහැදිලි කිරීම / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| (ඈ) වතක්ම් කළමනාකරණය | (ඈ) වත්කම් කළමනාකරණය |
| | ආයතනය සතු දේපල සහ පිරියත වෙනම හදුනා ගැනීමට හැකිවන ලේඛන දැනටමත් ආයතනය සතුව ඇත. කල් ඉකුත්වූ වත්කම් හදුනා ගැනීමටත්, ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මේ වන විටත් කටයුතු කරමින් පවතී. |
| (ඉ) අත්තිකාරම් | (ඉ) අත්තිකාරම් |
| | අත්තිකාරම් ගෙවීමේදී යම් යම් කාර්යය වල ස්වභාවය අනුව අත්තිකාරම් තුලනය කිරීම් ප්‍රමාද වී තිබුනද කිසිදු වංචාවකින් තොරව සියළු අත්තිකාරම් මුදල් පියවා ඇත. |

**අ/ක එම්.එම්.පි.ඩි සමරසේකර**
**අධ්‍යක්ෂ**
**තාක්ෂණික ආයතනය**
**මොරටුව විශ්වවිද්‍යාලය**